# කොළඹ මහා නගර සභාව

## පුරප්පාඩු දැන්වීම

**බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ කොළඹ මහා නගර සභාවේ ගිනි නිවීම් සේවයේ ගිනිභට තනතුර සඳහා බඳවා ගැනීම 2018**

කොළඹ මහා නගර සභාවේ පුරප්පාඩුව පවතින බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ගිනි නිවීම් සේවයේ ගිනිභට තනතුරු සඳහා බඳවා ගැනීමට බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිය සහිතව පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලංකාවේ පිරිමි පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

අයදුම්කරුවන් පහත දැක්වෙන ආදර්ශ ආකෘතිය අනුව A4 ප්‍රමාණයේ කඩදාසිවල දෙපැත්තෙහිම යතුරු ලියනය කොට හෝ පැහැදිලි අත් අකුරින් පිළියෙළ කරගත් අයදුම්පතක් **"නාගරික කොමසාරිස්, නාගරික කොමසාරිස් කාර්යාලය, කොළඹ මහා නගර සභාව, පුරහල, කොළඹ 07"**. යන ලිපිනයට **2018.11.15** වන දින හෝ ඊට ප්‍රථම ලැබෙන ලෙස ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම් පත් බහාලන කවරයේ වම්පස **(බ.ප.) පළාත් රාජ්‍ය සේවයේ කොළඹ මහා නගර සභාවේ ගිනි නිවීම් සේවයේ ගිනිභට තනතුර සඳහා** යනුවෙන් සඳහන් කළ යුතු අතර, 2018.11.15 වන දිනට පසුව ලැබෙන අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

1. තනතුරු නාමය :- බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ගිනි නිවීම් සේවයේ ගිනිභට තනතුර
2. මාසික වැටුප් ක්‍රමය :- රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 3/2016 අනුව RS- 1 – රා.ප.චක්‍රලේඛ 03/2016

   29540 – 7x300 – 27x370 – 41630/-

   වැටුප් ගෙවනු ලබන්නේ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 හි උපලේඛන අංක **II** සඳහන් පරිදිය

3. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණවලට ඔබ යටත් විය යුතුය.
4. තනතුරට අදාළ අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් :-

   I. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වීම.
   II. අයදුම්පත් කැඳවන අවසාන දිනට පූර්වාසන්න වසර 03 ක් අඛණ්ඩව බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිකරුවෙකු වීම.
   III. අවිවාහක පිරිමි අයෙකු විය යුතුය.
   IV. යහපත් චරිතයකින් යුක්ත විය යුතු අතර නීති විරෝධී ක්‍රියාවන්ට සම්බන්ධ නොවූ අයෙකු බව පොලිස් වාර්තාවකින් සනාථ කල යුතුය.
   V. තනතුරට බඳවා ගැනීම සඳහා නියම කර ඇති සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් වන සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.
   VI. එක් වරකදී සිංහල /දෙමළ භාෂාව හා ගණිතය ඇතුලුව විෂයන් හතරකට සම්මාන සාමාර්ථ සහිතව අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගය විෂයන් 06 කින් සමත් වී

තිබිය යුතු අතර එම අවස්ථාවේදී හෝ තවත් එක් අතිරේක අවස්ථාවකදී විද්‍යාව හා ඉංග්‍රීසි භාෂාව විෂයන් ද සමත්වී තිබිය යුතුය.

VII. අයදුම්කරුවන් උස සෙ.මී.162 කට නො අඩු සහ ජෛව ස්කන්ධ දර්ශකය නියමිත පරිදි තිබිය යුතුය.(ජෛව ස්කන්ධ දර්ශකය 18.5 සිට 24 දක්වා විය යුතුය)

VIII. සෑම අපේක්ෂකයෙකුම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරී කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

IX. දෘෂ්ඨිය පිළිබඳ අවශ්‍යතාවයන් - උපැස් යුවලක් හෝ ස්පර්ශ කාච රහිතව ඇස් පෙනීම අවම වශයෙන් 6/6 සහ 6/12 අතර ද වර්ණ පෙනීම ද සාමාන්‍ය විය යුතුය.

X. කෘතිම ශාරීරික වෙනස්කම් කර නොතිබිය යුතුය.(පච්ච කොටා තිබීම වැනි )

5. වයස් සීමාව

වයස අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර අවුරුදු 24 ට නොවැඩි විය යුතුය.

6. බඳවා ගැනීමේ ක්‍රමය

ලිඛිත පරික්ෂණයෙන් හා වෘත්තිය (ප්‍රායෝගික) පරික්ෂණයෙන් ලබා ගන්නා ලකුණුවල කුසලතා අනුපිළිවෙල අනුව පුරප්පාඩු සඳහා ආධුනික ගිනිභටයින් වශයෙන් තෝරා ගනු ලැබේ.

I. පුහුණුව ආරම්භ කිරීමට පෙර සියලුම ආධුනික ගිනිභටයින් කායික හා මානසික යෝග්‍යතාවය තහවුරු කිරීම සඳහා වෛද්‍ය පරික්ෂණයකට භාජනය කරනු ලැබේ.

II. පුරප්පාඩු සඳහා තෝරාගන්නා අයවලුන් එක් අවුරුදු ගිනිභට පුහුණු පාඨමාලාව හැදෑරිය යුතුය.. පුහුණු කාල සීමාව තුල දී වැඩ, හැසිරීම හා පැමිණීම සතුටුදායක නොවන හෝ අපේක්ෂිත රැකියා මට්ටමට ලගා නොවන ආධුනික ගිනිභටයින් කිසිම වන්දියකින් තොරව පුහුණුවෙන් ඉවත් කරනු ලැබේ.

III. සාර්ථකව අදාළ පුහුණුව අවසන් කරන ආධුනික ගිනිභටයින් ගිනිභට තනතුර සඳහා ස්ථිරව බඳවා ගනු ලැබේ. පුහුණු කාලසීමාව ස්ථිර සේවා කාලය සඳහා ගණනය කරනු ලබන අතර පුහුණුව අවසන් කොට සේවයේ පිහිටුවන අවස්ථාවේ දී අදාළ වැටුප් පරිමාණයේ දෙවන පියවරේ තබනු ලැබේ.

IV. පුහුණු කාලසීමාව තුළ රු 10,000ක මාසික දීමනාවක් ගෙවනු ලැබේ.

V. පුහුණු කාලසීමාව තුළදී කිසිම ආධුනික ගිනිභටයෙකුට විවාහ වීමට අවසර දෙනු නොලැබේ.

VI. පුහුණුවට තෝරාගන්නා ලද ආධුනික ගිනිභටයින් ස්ථිර තනතුරට පත්කිරීමෙන් අනතුරුව පත් කළ දින සිට වසර 05 ක කාලසීමාවක් අදාළ පළාත් පාලන ආයතනයේ සේවය කරන බවට පත්කිරීම් බලධරයා සමඟ රු 500,000/- ක (රුපියල් ලක්ෂ පහක) වටිනාකමකින් යුතු බැදුම්කරයක් පුහුණුව ආරම්භ කරන අවස්ථාවේදී අත්සන් කළ යුතුය.

VII. ආධුනිකයාගේ අභිමතය පරිදි පුහුණු කාලය තුළ පුහුණුවෙන් ඉවත් වන්නේ නම් පුහුණුවට වැය වු සියලු වියදම් ආයතනය වෙත ගෙවීමට කටයුතු කළ යුතුය.

VIII. ගිනිභට තනතුර සඳහා පත්වීම ලැබු පත්වීම්ලාභින් අදාළ පළාත් පාලන ආයතන බල ප්‍රදේශයේ පදිංචි වන ලෙස නියම කළ හැකිය.

6.1 ලිඛිත විභාගය

| විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්ෂණය | 100 | 40 |

6.2 වෘත්තීය පරීක්ෂණය

( ලිඛිත විභාගයෙන් සමත් අයදුම්කරුවන් සඳහා වන වෘත්තීය පරීක්ෂණය - ප්‍රායෝගික )

| විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| දරා ගැනීමේ හැකියාව | 60 | 36 |
| සමබරතාවය | 40 | 24 |

7. තනතුරට අදාළව බලපාන සේවා කොන්දේසි හා අනෙකුත් කොන්දේසි.

ආයතන සංග්‍රහයේ රෙගුලාසි වලටද බස්නාහිර පළාත් සභාවේ මුදල් රෙගුලාසි වලටද බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කලින් කළ පනවනු ලබන වෙනත් කොන්දේසි වලටද අදාළ පළාත් පාලන ආයතනයේ ආයතන ප්‍රධානියාගේ නියෝග වලටද අනුකූලව ක්‍රියාකල යුතුය. මෙම තනතුරේ සේවය බස්නාහිර පළාත තුළට පමණක් සීමා වේ.

මෙම තනතුරු සඳහා බඳවා ගැනීම් සම්බන්ධයෙන් අවසාන තීරණය පත්වීම් බලධරයා සතුවේ.

වී.කේ.ඒ. අනුර
නාගරික කොමසාරිස්,
කොළඹ මහා නගර සභාව.

2018.10 ....... වන දින
නාගරික කොමසාරිස් කාර්යාලය,
කොළඹ මහා නගර සභාව.
පුරහල, කොළඹ 07.

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා

## <u>ආදර්ශ අයදුම් පත්‍රය</u>

**<u>බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ කොළඹ මහා නගර සභාවේ ගිනි නිවීම්</u> සේවයේ ගිනිහට <u>තනතුරු සඳහා</u>**

**<u>බඳවා ගැනීම 2018</u>**

1. සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) (Mr) :-

2. මුලකුරු සමඟ නම (සිංහලෙන්/) :-

   ..................................................................................................................

   ..................................................................................................................

3. I. ස්ථිර ලිපිනය (සිංහලෙන්) :-

   ..................................................................................................................

   ..................................................................................................................

   II. දැනට පදිංචි ලිපිනය

   ..................................................................................................................

   ..................................................................................................................

   ..................................................................................................................

4. උපන් දිනය :-අවුරුද්ද ☐☐☐☐ මාසය ☐☐ දින ☐☐

5. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස :-අවුරුදු ☐☐ මාස ☐☐ දින ☐☐

   (උප්පැන්න සහතිකයේ, සහතික කළ පිටපතක් ඇමිණිය යුතුය)

6. ජාතික හැඳුනුම්පත් අංකය :- ☐☐☐☐☐☐☐☐☐☐☐☐

7. විවාහක/අවිවාහක :-..................................................................................

8. දුරකතන අංකː පෞද්ගලික/කාර්යාලීය :-......................................................................

9. බස්නාහිර පළාතේ ස්ථිර පදිංචි කාලසීමාව :-----------------------------------------------

   (ග්‍රාම සේවා සහතිකයේ ඡායා පිටපතක් අමුණා සනාථ කළ යුතුය)

10. උස ප්‍රමාණය (සෙන්ටි මීටර්වලින්) :-------------------------------------------

11. අධ්‍යාපන සුදුසුකම් :- ..................................................................................

..................................................................................................

..................................................................................................

(සුදුසුකම් සහතික කිරීමට අදාළ සහතික වල සහතිකවල ඡායා පිටපත් ඇමිණිය යුතුය.)

12. වෘත්තීය සුදුසුකම් :- (තිබේනම් පමණි.)..................................................................................

..................................................................................................

13. වෙනත් සුදුසුකම් (ක්‍රීඩා හා වෙනත්) :-..................................................................................

..................................................................................................

(සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා සහතික කළ ඡායා පිටපත් ඇමිණිය යුතුය.)

14. I. ඔබ කිසියම් සාපරාධී වරදක් සම්බන්ධයෙන් කෙදිනකදී හෝ උසාවියකදී වරදකරු වී තිබේද? (ඔව්/නැත)

II. ඔබගේ පිළිතුර 'ඔව්' නම් වරදේ ස්වභාවය හා දඬුවම කුමක්ද?

..................................................................................................

..................................................................................................

15. ඔබ රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයෙන් මීට පෙර සේවයෙන් පහකළ හෝ ඉල්ලා අස්වූ තැනැත්තෙක්ද? (ඔව්/නැත)

16. I. දැනට දරණ තනතුර (සිංහලෙන්):-..................................................................................

II. එම තනතුරට පත්වූ දිනය :-..................................................................................

III. සේවය කරන දෙපාර්තමේන්තුව/අංශය :-..................................................................................

ඉහතින් මා විසින් සඳහන් කරන ලද කරුණු මාගේ දැනීම හා විශ්වාසය පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කර සිටින අතර, කිසියම් තොරතුරක් අසත්‍ය බව හෝ වැරදි බව මා බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ කොළඹ මහා නගර සභාවේ ගිනි නිවීම් සේවයේ ගිනිහට තනතුරකට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු වන බවත්, තෝරාපත් කර ගැනීමෙන් පසු අනාවරණය වුවහොත් කිසිඳු වන්දියකින් තොරව සේවයෙන් පහකළ හැකි බවත් මා දනිමි.

දිනය :- ..............................

..............................

අයදුම්කරුගේ අත්සන